# පිළිතුරු පත්‍රය

01 (i) (අ) කප්පට නම් වෙළෙන්දාගේ
(ආ) සද්ධර්ම රත්නාවලිය
(ii) (අ) කිඳලෙක - කුඩා දිය වළෙකි
පුවතර - ප්‍රසිද්ධ
(ආ) අලගියවන්න මුකවෙටි තුමා
(iii) (අ) ඉයෝනා පොටපොෆ්ගේ
(ආ) වැලපීම කෙටිකතාවේ සඳහන් ඉයෝනා පොටපොෆ් ඉස්තාලයට ගොස් එහි සිටි තම අශ්වයා දුටු අවස්ථාවේ විමසන ලද්දකි.
(iv) (අ) වැහි වලාකුළ
(ආ) නිවටයෝද උසස් වෙති
(v) (අ) කුදී
(ආ) කුස කුමරු (ලකුණු 4 x 5 = 20)

02 (i) අලුත ගෙනා මනාලිය පිළිබඳ මනාලයා තුළ පහළ වූ හැඟීම් සමුදාය පැවසීම (ලකුණු 05 යි)
(ii) භාෂාව සරලය. (ඕනෑම අවස්ථාවක් නිදසුන් ලෙස දක්විය හැකි ය.)
ව්‍යංග්‍යාර්ථවත් ය.
නිදසුන් - පෙනෙයි ඇ
ඇසෙයි
දැනෙයි
මට ගේ හැම තැන
වාග් චිත්‍ර මැවීමෙහි සමත් ය.
දූල් තිර අස්සෙන්
පෙනෙයි ඇ
ඔබ යනු මොබ එනු
පට පිළී ගෙන අබරණ පෙට්ටි ගෙන (ලකුණු 05 යි)
(iii) හිස නමා ගති ඇ
සිහින් රතැඟිලි පටලවා ගති
සතියකට පෙර ගෙනා වර
විළිබර ය මෙගෙ රන්වන් මනාලිය

වුවමනාවන් කිසිත් නැතිවද
නො රැඳෙයි පලා යෙයි (ලකුණු 05 යි)
(iv) හිස නමා ගති ඇ
සිහින් රතැඟිලි පටලවා ගති

දූල් තිර අස්සෙන්
පෙනෙයි ඇ
ඇසෙයි
දැනෙයි
මට ගේ හැම තැන (ලකුණු 05 යි)
(v) මගේ රන්වන් මනාලිය
ගෑ විලවුනෙහි
නැත, රන්වන් සමෙහි
හෙළන සුස්මෙහි සුවඳ ය ඒ
ඇ බඳ සුවඳ
දැනෙන්නේ මට විතර ද?

පෙනෙයි ඇ
ඇසෙයි
දැනෙයි
මට ගේ හැම තැන (ලකුණු 05 යි)

03 (i) පසේ බුදුන්ට කැවුම් පූජාකොට ඇ යොදුන් සියයක දුර සිටිය බෝසතුන්ගේ බලයෙන් ගෙන්වා ගෙන තමාය බිරිඳ කරගන්නට සමත් වේවා ! යන්න. (ලකුණු 05 යි)

(ii) කෝපයට පත්ව පසේ බුදුන්ගේ පාත්‍රයේ තිබූ කැවුම් ගත් හෙයින් (ලකුණු 05)

(iii) අලුයම සාගල නුවරට ගොස් ප්‍රභාවතීන් ආපසු කැඳවා ගෙන ඒම (ලකුණු 05)

(iv) පියාණන් වහන්සේට හෝ මලණුවන්ට රාජ්‍ය පවරා දීමෙන් ආපසු ලබාගත නොහැකි බව වටහා ගෙන මෑණියන් වහන්සේට රාජ්‍යය පැවරීම (නිදසුන් උද්ධෘත ඇසුරෙන් පැහැදිලි කර තිබිය යුතු ය.) (ලකුණු 10 යි)

(ලකුණු 25 යි)

නැතහොත්

(i) අදීන මිනිසෙකු ලෙස සමාජයේ ජීවත් වීමේ දී කෙනෙකු සිය සිතුම් පැතුම් හැඩ ගසා යුතු ආකාරය. (ලකුණු 05)

(ii) නම්බුව කැමති අය සිහි මුළා කර නොගෙන කටයුතු කළ යුතු ය. (ලකුණු 05 යි)

(iii) හේද හින්නව සිටීම, සහජීවනයෙන් තොර වීම, නිලධාරීන්ට ගැති වීම, බියසුලු ගතිය (ලකුණු 05 යි)

(iv) භාෂාව විටෙක සරල ය. (නිදසුන් දක්වා තිබිය යුතුය ය.)
ව්‍යංග්‍යාර්ථවත් ය. (අපේ අතට අවනත කරගෙන වහම)
බස විධානාර්ථයේ යොදා ගැනීම තේමාව කුළුගැන්වීමට සමත් වේ. (ඉතින් යමවු, ඉතින් අඬ ගසවු, දිවි දෙමු, විශ්වාසය දෙන්ට එපා ආදී ... ) (ලකුණු 10 යි)

(ලකුණු 25 යි)

4, 5, 6, 7 ප්‍රශ්නවලින් එක් ප්‍රශ්නයක් සඳහා නිදසුන් 03 ක් සඳහා ලකුණු 03
සමස්ත විස්තරයට ලකුණු 12
මුළු ලකුණු 15 බැගින්